ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 33 දරන මිල පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි                                        තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 33 දරන මිල පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 23/78

**මිල පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 33 දරන මිල පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 43 දරන පනතින් සංශෝධිත මිල පාලන පනතේ 6 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — **173 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(ඊ) මිල පාලන ත්‍යාග අරමුදල පිහිටුවීමට ආනුෂංගික වූ හෝ එයට සම්බන්ධ වූ හෝ සියලු කරුණු සහ ඒ අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ආකාරය ;".

**3.** ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 43 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය අත්හැරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— — **ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(i) ඒ වරද, ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ වූ හෝ යටතේ වූ ලෙස සැලකෙන නියමයකින් භාණ්ඩයක් සඳහා නියම කරන ලද උපරිම මිලට වැඩියෙන් ඒ භාණ්ඩය විකිණීමෙන් ඒ නියමය කඩ කිරීමක් නම් හෝ එවැනි නියමයකින් උපරිම මිල නියම කරනු ලැබූ යම් භාණ්ඩයක් රැස්කර සඟවා තබා ගැනීම වැළැක්වීම සඳහා වූ නියෝගයක් කඩ කිරීමක් නම්, බර පතළ වැඩ ඇතිව සති හතරකට නොඅඩු සහ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් සහ, ඊට අමතරව රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් හත් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන පහත දැක්වෙන අලුත් වගන්ති එම ප්‍රඥප්තියේ 8අ වන සහ 8ආ වන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— — **8අ සහ 8ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.**

"**දඩයෙන් කොටසක් මිල පාලන ත්‍යාග අරමුදලට ගෙවනු ලබන ලෙස අධිකරණය විධාන කළ යුතු බව.** — 8අ. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු යම් අධිකරණයක් ඉදිරියෙහි වරද කරු කරනු ලැබුවේ ද ඒ වරද සඳහා නියම කරන ලද දඩයෙන් දෙකෙන් එක් කොටසක් හෝ ඒ වරදකරුගෙන් ඇත්ත වශයෙන් ම අයකර ගනු ලැබූ මුදලෙන් දෙකෙන් එක් කොටසක් හෝ මේ

පනත යටතේ පිහිටුවනු ලැබූ මිල පාලන ත්‍යාග අරමුදලට ගෙවන ලෙස ඒ අධිකරණය විසින් විධාන කළ හැකි ය.

මිල පාලන ත්‍යාග අරමුදල.

8ආ. (1) (මේ වගන්තියේ මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මිල පාලන ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) (අ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අධිකරණයක් විසින් හෝ එහි විනිශ්චයකාරවරයකු විසින් හෝ ස්වකීය අභිමතය පරිදි විනිශ්චයකාරවරයකු විසින් හෝ අරමුදලට ගෙවනු ලැබිය යුතු යයි විධාන කරනු ලබන සියලු මුදල් ; සහ

(ආ) ගෙවීම් සඳහා සාදනු ලබන නියෝග අනුව කරනු ලබන වෙනත් ගෙවීම්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) ඒ මිල පාලන පරීක්ෂකවරුන්ට ත්‍යාග වශයෙන්, ඒ සඳහා සාදනු ලබන නියෝග අනුව දෙනු ලබන සියලු ගෙවීම් ;

(ආ) අරමුදල පරිපාලනය කිරීමෙහි ලා දරනු ලබන වියදම් ; සහ

(ඇ) ගෙවීම් සඳහා සාදනු ලබන නියෝග අනුව කරනු ලබන සියලු ගෙවීම්

අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදල පරිපාලනය කිරීම සඳහා මිල පාලක වරයා වගකිව යුතු අතර අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.".